www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තෙල් කම්කරු වර්ජනය ශ්‍රී ලංකා ආන්ඩුවේ අර්බුදය උත්සන්න කරයි

## Oil workers' strike heightens Sri Lankan government crisis

**කේ. රත්නායක විසිනි**
**2004 අගෝස්තු 21**

මැතිවරන පොරොන්දු කඩ කිරීම හා සමාජ කොන්දේසි නරක අතට හැරීම අරබයා පුලුල්ව පැතිරුනු වෛරයකට දැනට මත් මුහුන දී සිටින ශ්‍රී ලංකාවේ සුලුතර එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව අගෝස්තු 13 දා ඇරඹුනු තෙල් කම්කරු වර්ජනයක් හේතු කොට ගෙන බැරෑරුම් අර්බුදයකට මැදි වී සිටී. අගෝස්තු 18 දා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සමග තාවකාලික එකඟතාවකට පැමිනීම මගින් තව දුර කාර්මික ක්‍රියාවන් වලකා ගැනීමට සමිති නායකයන් සමත් වුවත් වර්ජනයට පාදක වූ ගැටලු එකක් වත් විසඳී නැත.

ප්‍රධාන සිපෙට්කෝ තෙල් ගබඩා සංකීර්නයේ 2,800ක් පමන වන කම්කරුවෝ රජය සතු සංස්ථාව ආංශිකව පුද්ගලීකරනය කිරීමේ ආන්ඩුවේ සැලසුම්වලට විරෝධය පාමින් වැඩ නතර කලහ. සිල්ලර තෙල් පිරවුම් හල්වල කොටස් භාරත් පෙට්‍රෝලියම් කෝපරේෂන් නම් වූ ඉන්දියානු සමාගමට විකිනීම පිනිස රහස් ගිවිසුමක් ගසා ඇතැයි චෝදනා කල වෘත්තීය සමිති එය අහෝසි කරන ලෙස ඉල්ලා සිටියහ.

වැඩ නැවැත්වීම නිසා තෙල් නිෂ්පාදන බෙදා හැරීම නතර වූ අතර පෙට්‍රල් හා ඩීසල් සැපයුම්වලට එය වහා ම බල පෑවේ ය. බොහෝ පිරවුම් හල් වසා දැමුනු අතර කොලඹ හා සෙසු නගරවල පිරවුම් හල් අසල දිගු වාහන පෝලිම් දක්නට ලැබුනි. පුද්ගලික බස් සහ ත්‍රිරෝද කුලී රථ විශාල සංඛ්‍යාවක ධාවනය ඇන හිටුවීමට සිදු විය.

විදුලි බල හා බල ශක්ති නියෝජ්‍ය ඇමති කුමාර වෙල්ගම ඔවුන්ගේ වැඩ පොලට පැමිනි විට ඔහුට කතා කිරීම වර්ජක කම්කරුවෝ ප්‍රතික්ෂේප කලහ. ඔවුන්ගේ ප්‍රකාශකයෙක් මාධ්‍යවලට මෙසේ පැවසී ය: "අපි මේ ආන්ඩුවට සහයෝගය දුන්නේ එය සිපෙට්කෝ ආයතනය විකිනීම හෝ පුද්ගලීකරනය නො කරන බවට පොරොන්දු වූ නිසයි. ඒත් දැන් ඔවුන් අප දරුනු ලෙස අපේක්ෂා භංගත්වයට පත් කරලා." පසු ගිය වසරේ දී පැවති එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව සිය ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලෙහි කොටසක් ලෙස ඉන්ධන පිරවුම් හල් 100ක් ඉන්දියානු තෙල් සමාගමට (අයිඕඑල්) අලෙවි කලේ ය.

පසු ගිය සතියේ වර්ජනය සේවකයන් 5,200කින් යුත් සංස්ථාවේ සමස්ත ශ්‍රම බලකාය ම වෙලා ගත් අරගලයක් බවට වර්ධනය වීමේ තර්ජනය මතු විය. එහෙත් වෘත්තීය සමිති ජනාධිපති කුමාරතුංග සමග පැවැත්වීමට නියමිත සාකච්ඡා බලාපොරොත්තුවෙන් කාර්මික ක්‍රියාව අත් හිටුවී ය. විදුලි බල හා බල ශක්ති ඇමති සුසිල් ප්‍රේමජයන්ත පෙරලා දිවයිනට පැමිනීම බලාපොරොත්තුවෙන් අඟහරුවාදා තෙක් බලා සිටින ලෙස කුමාරතුංග අවධාරනය කලා ය. තමන් අසනීපයෙන් සිටින බව ජනාධිපතිනිය පැවසීමෙන් අනතුරුව සාකච්ඡා තවත් දිනකින් පමා විය.

තිරයට පිටු පසින් තියුනු සාකච්ඡා සිදු වූ බවට කිසිදු සැකයක් නැත. අප්‍රේල් මැතිවරනයෙන් පසුව එජනිසය බලයට පත් වූයේ පුද්ගලීකරනය නතර කොට, වැටුප් වැඩි කොට, රැකියා සපයා, සහනාධාර පුනස්ථාපනය කොට පවත්වා ගෙන යන බවට පොරොන්දු වෙමිනි. එහෙත් නැගෙන හර්ගෝලීය තෙල් මිල මගින් උත්සන්න කෙරුනු දරුනු මූල්‍ය අර්බුදයකට මුහුන දී සිටින ආන්ඩුව සිය පොරොන්දුවලින් බොහොමයක් අත හැර දමා ඇති අතර එම තතු කම්කරුවන් හා ගම්බද දුගීන් අතර නො සන්සුන්තාව වැඩීමට තුඩු දී තිබේ.

වර්ජනයට එක් වූ සමිතිවලින් බොහොමයක් කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ඇතුලු එජනිස පක්ෂවලට අනුබද්ධිත ඒවා ය. සමිති නිලධාරීන්ට වර්ජනය කැඳවීමට බල කෙරුනේ වැටුප් වැඩි වීමක් සිදු නො කිරීමත් පුද්ගලීකරනය මගින් සිය රැකියාවලට එල්ල වන තර්ජනයත් සම්බන්ධයෙන් තෙල් කම්කරුවන් අතර වැඩෙන වෛරය හේතු කොට ගෙන ය. කෙසේ වෙතත් එකදු සමිතියක් වත් කිසිදු විකල්පයක් ඉදිරිපත් නො කරයි. සංස්ථාවේ කොටස් අලෙවිය සම්බන්ධයෙන් ජවිපෙ දක්වන ප්‍රධාන විරුද්ධත්වය වන්නේ එම කොටස් "විදේශ සංගත" අතට යන බවයි.

වරාය, දුම්රිය, සෞඛ්‍ය හා ප්‍රවාහන යන ක්ෂේත්‍රවල සමිති ඇතුලු ජවිපෙ අනුබද්ධිත සමිති 50ක් පමන ආරාවුල සම්බන්ධයෙන් පැවැත්වෙන සාකච්ඡා අසාර්ථක වුව හොත් තෙල් කම්කරු වර්ජනයට තමන් ද එක් වන බවට ඉරිදා තර්ජනය කලහ. සංගතකරනය

හෝ පුද්ගලික ව්‍යවසායන්ට විකුනා දැමීම මගින් මෙම සියලු අංශවල ද රැකියා හා කොන්දේසි කප්පාදු කිරීමට නියමිතව ඇත.

බදාදා කුමාරතුංග සහ සමිති ආරාවුල සංසිඳුවීමට උත්සාහ කලහ. ජනාධිපතිනිය තවත් ඉන්ධන පිරවුම් හල් 100ක් "තෙවන පාර්ශ්වයකට" විකිනීම පිලිබඳව තම ආන්ඩුව සලකා බලමින් සිටි බව පිලිගත් අතර සමිතිවල අදහස් විමසීමකින් තොරව ඒ සම්බන්ධ කටයුතු ඉදිරියට ගෙන නො යන බවට පොරොන්දු වූවා ය. එයට හිලව් වසයෙන් සමිති නිලධාරීන් ජනාධිපතිනියට සහතික වූයේ කම්කරුවන් "මහජනතාව අපහසුතාවට පත් කරන හෝ ආන්ඩුවේ සංවර්ධන සැලසුම් කඩාකප්පල් කරන හෝ ක්‍රියා මාර්ගවලට නො එලඹෙන" බවට යි.

කුමාරතුංගගේ ඉල්ලීමට අනුව, "(සංස්ථාවේ) මූල්‍ය අර්බුදය විසඳා ලීම" පිලිබඳ තම යෝජනා ඉදිරිපත් කිරීමට ද සමිති පොරොන්දු විය. කෙසේ වෙතත් මොන යම් හෝ "විසඳුමක" අනිවාර්ය අර්ථය වනු ඇත්තේ රැකියා හෝ වැටුප් හා කොන්දේසි කප්පාදුව මගින් අර්බුදයේ බර දැරීමට තෙල් කම්කරුවන්ට සිදු වනු ඇත යන්න යි. මෙම කැප කිරීම් "තරගකාරී" හා "ශක්‍ය" වීමේ නාමයෙන් කලමනාකරනය විසින් ඉදිරිපත් කරනු ලබන ඊලඟ ඉල්ලීම් මාලාව සඳහා මාවත සකසනු ඇත.

## වැඩෙන නො සන්සුන්තාව

එවන් පිලිවෙත් පැටවීමට සමිති නායකයන් සමත් වේ ද යන්න වෙනත් කාරනාවකි. වෘත්තීය සමිති ද ඇතුලු සමස්ත දේශපාලන සංස්ථාපිතය ම සම්බන්ධයෙන් කම්කරුවන් අතර පවතින්නේ ප්‍රගාඪ අවිශ්වාසයකි. බලයට පැමින යන්තම් සිව් මසක් ගත වන තතු යටතේ ජීවන මට්ටම් කඩා වැටීම සහ රැකියා, සේවාවන් හා කොන්දේසි මත එල්ල වන අඛන්ඩ ප්‍රහාර අරබයා වැඩෙන මහජන නො සන්සුන්තාවකට එජනිසය මුහුන දී සිටී. මෑත වර්ධනය වූ වර්ජන හා විරෝධතා ව්‍යාපාරවලට මේවා ඇතුලත් ය:

• දුම්රිය කම්කරුවන් දුම්රිය අධිකාරී පනත අහෝසි කරන ලෙස ඉල්ලමින් උද්ඝෝෂනයක් අරඹා ඇත. මෙම පනතේ එල්ලය වන්නේ රැකියා දහස් ගනනක් කප්පාදු කරමින් දුම්රිය සේවය ලාභ ලබන සංස්ථාවක් බවට පරිවර්තනය කිරීම යි. මෙම පනත අහෝසි කරන බවට මැතිවරනයට පෙරාතුව එජනිසය පොරොන්දු විය. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂයට (එජාප) අනුබද්ධිත සමිති පනත අහෝසි කරන ලෙස ඉල්ලා බදාදා පිකට් උද්ඝෝෂනයක් පැවැත්වී ය. පාලක එජනිසයට අනුබද්ධිත සමිති කෝපාවිෂ්ට සාමාජිකයන්ගේ බල කිරීම යටතේ අගෝස්තු 23 දාට විරෝධතා ව්‍යාපාරයක් කැඳවා තිබේ.

• පසු ගිය සඳුදා හැටන් ප්‍රදේශයට ආසන්න කොටගල වතු යායේ 5,000කට අධික කම්කරුවෝ වැටුප් වැඩි වීමක් ඉල්ලා වැඩ නතර කලහ. දහසක් පමන වර්ජක කම්කරුවෝ කොටගල දී පිකට් උද්ඝෝෂනයකට එක් වූහ. වර්ජනය සඳහා මූලිකත්වය ගත්තේ වෘත්තීය සමිති නො ව මානව අයිතිවාසිකම් සංවිධානයකි. සමිති තමන්ගේ අයිතීන් හා කොන්දේසි සඳහා සටන් වැදීම ප්‍රතික්ෂේප කිරීම හේතු කොට ගෙන සමිතිවලට සාමාජික මුදල් ගෙවීම අත් හිටුවීමට කම්කරුවන් තීරනය කොට ඇත. ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ වඩාත් ම පීඩිත කොටසක් වන දෙමල කතා කරන වතු කම්කරුවන් අතර වැඩෙන පුලුල් අසන්තුෂ්ටිය මෙම විරෝධතාව මගින් එලිදරව් වේ.

• උසස් වීම් පරිපාටිය අත් හිටුවීමේ පරිපාලන තීන්දුව ඉවත් කර ගන්නා ලෙස ඉල්ලමින් විවෘත විශ්ව විද්‍යාලයේ සමස්ත අධ්‍යයන කාර්ය මන්ඩලය ම අගෝස්තු 5 දා සිට වර්ජනයක යෙදී සිටිති. බදාදා එම විශ්ව විද්‍යාලයේ ම අනධ්‍යයන කාර්ය මන්ඩලයට අයත් සිය ගනනක් දෙනා අධ්‍යයන කාර්ය මන්ඩලයට සහයෝගය පිනිස වැඩ නතර කොට ප්‍රශ්නය විසඳීමට ආන්ඩුව අපොහොසත් වුව හොත් තව දුර ක්‍රියා මාර්ගවලට එලඹෙන බවට ද අනතුරු ඇඟවූහ.

• අමාත්‍යාංශය මුදල් නැතැයි කියමින් අතුරු වෛද්‍ය සේවකයන්ගේ හදිසි කැඳවුම් සේවාවන් සඳහා වැටුප් ගෙවීම නතර කර ඇති නිසා එම සේවකයන් කැඳවුම් සේවාවන්හි යෙදීම ප්‍රතික්ෂේප කර ඇත. හෙදියන්ට අතිකාල දීමනා ගෙවා නැත. පසු ගිය සැප්තැම්බරයේ දී 80,000ක සෞඛ්‍ය සේවකයන් සහභාගි වූ දින 13ක් පැවති වර්ජනයක් පැවති එජාපෙ ආන්ඩුව බැරෑරුම් අර්බුදයකට ලක් කලේ ය. ආන්ඩුව එයට ප්‍රතිචාර දැක්වූයේ රෝහල්වලට හමුදාව යෙදීමෙනි. එම වර්ජනය පිපිරීමට තුඩු දුන් වැටුප් ප්‍රශ්නය තව මත් විසඳී නැත.

• පුද්ගලික අංශයේ කැනේඩියානු බහු-ජාතික සංගතයකට අයත් බාටා පාවහන් සමාගමේ 500ක් පමන වන කම්කරුවෝ ජූනි මස සිට රැකියා රැක ගැනීමේ කටුක අරගලයක යෙදී සිටිති. පොලීසිය මේ මාසය ඇතුලත වර්ජකයන්ට එරෙහිව මෘග ප්‍රහාර දෙකක් දියත් කර ඇත -- පලමු වැන්න කම්හලේ කම්කරු වාඩි ලෑම නතර කිරීමට යි. දෙවැන්න කම්හල් ගේට්ටුව අසල කම්කරුවන් පවත්වා ගෙන ගිය බාධකය බිඳ දැමීමට යි. පසු ගිය සඳුදා පුද්ගලික අංශයේ දහස් ගනන් කම්කරුවෝ බාටා සේවකයන්ට සහාය පිනිස විරෝධතා ව්‍යාපාරයකට සහභාගි වූහ.

ජීවන මට්ටම් අඛන්ඩව පහල වැටීම සම්බන්ධයෙන් නාගරික හා ගම්බද දුගීන් අතර වෛරය වැඩෙමින් ද පවතී. තෙල් කම්කරුවන් වර්ජනයට එලඹුනු දින ම ආන්ඩුව පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 3කින් ද ඩීසල් ලීටරයක මිල රුපියල් 4කින් ද නැංවී ය. ඒ ඊට යන්තම් සතියකට පෙර පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 6කින් ඉහල දැමීමට අමතරව ය. ඉන්ධන වියදම් ඉහල යාම සෙසු භාන්ඩවල මිල ගනන් නැගීමට තුඩු දීම නො වැලැක්විය හැකි වනු ඇත. පසු ගිය මාස පහ තුල දී ජීවන වියදම් දර්ශකය මාර්තු මස තිබූ 3,426 සිට ජූලි

මස වන විට 3,675 දක්වා ඒකක 249කින් නැත හොත් සියයට 7.3කින් පිම්මේ ඉහල නැග තිබේ.

පැවති එජාපෙ ආන්ඩුව මෙන් ම කුමාරතුංග ද දුර දිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලකට කැප වී ඇත. දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.5ක් වෙතැයි අනාවැකි පල කෙරී ඇති අයවැය හිඟය අඩු කරන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වෙතින් එජනිසයට බලපෑම් එල්ල වී තිබේ. මෙම ඉලක්කය පවා ජය ගැනීමට නම් සහනාධාර හා පොදු සේවා තව දුරටත් කප්පාදු කල යුතු වනු ඇත.

පසු ගිය සතියේ නිකුත් කල මහ බැංකු නිවේදනයක් ආර්ථික වර්ධන අනුපාතය පිලිබඳ අනාවැකිය සියයට 6 සිට සියයට 5 හා 5.5 අතර අගයකට පහල දමා සහනාධාර -- විශේෂයෙන් ම ඉන්ධනවලට දෙන සහනාධාර -- තව දුරටත් කප්පාදු කරන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. ඉන්ධන මිල ගනන්වල මෑත වැඩි වීම් දැවැන්ත සමුච්චිත පාඩු පිරිමසා ගැනීම සඳහා ප්‍රමානවත් නො වන බව නිරීක්ෂනය කරමින් මහ බැංකුව මෙසේ ප්‍රකාශ කලේ ය: “අයවැය එවන් සහනාධාරවල වියදම ඇරීම දූරදර්ශී නො වනු ඇත. ඒ මක් නිසා ද කියතොත් එය සෙසු අත්‍යවශ්‍ය පොදු වියදම් කැප කිරීමකට සම වන බැවිනි.”

සීනි, මිරිස්, අර්තාපල් සහ ලූනු ඇතුලු විවිධ මූලික පාරිභෝගික භාන්ඩවලට දෙන සහනාධාර අහෝසි කිරීමට ආන්ඩුව සැලසුම් කරන බව පසු ගිය සතියේ දී මුදල් ඇමති සරත් අමුනුගම අනතුරු ඇඟවී ය. “අප අපගේ ආයෝජනයන් සහනාධාරවලින් ඉවතට මාරු කිරීමේ ප්‍රථම ඇඩි තීන්දුව ගන්නා බව තව සති තුන හතරකින් ඔබට දැන ගන්ට ලැබෙනු ඇත. . . . අපි හැමෝටම දෙවියන්ගේ ම පිහිටයි. ඒත් මා සිතන්නේ එසේ කිරීමට අපට සිදු වන බවයි” ඔහු පැවසී ය.

එවන් පියවරක් පුලුල්ව පැතිරුනු විරුද්ධත්වයක් අවුලුවා ලනු ඇතැයි ද එමෙන් ම ආන්ඩුව මුහුන දී සිටින දේශපාලන අර්බුදය තව දුරටත් උත්සන්න කරනු ඇතැයි ද අමුනුගම ඉතා හොඳින් දනී. සිය ආර්ථික න්‍යාය පත්‍රය ඉදිරියට තල්ලු කරනු පිනිස කුමාරතුංග තන්ත්‍රය මර්දනකාරී පියවර අනිවාර්යයෙන් ම යොදා ගනු ඇත: එනම්, බාටා කම්කරුවන්ට එරෙහිව එල්ල කල ප්‍රහාරය ආකාරයේ පොලිස් කඩා පැනීම් සහ කම්කරු පන්තිය අපසරනය කොට භේද කරනු පිනිස දෙමල විරෝධී ස්වෝත්තමවාදය ඇවිලවීම යි.

ජවිපෙ සහ සෙසු සිංහල අන්තවාදී කන්ඩායම් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාම සාකච්ඡා යලි ඇරඹීමේ ප්‍රයත්නයන්ට එරෙහි වර්ගවාදී උද්ඝෝෂනයක දැනට මත් යෙදී සිටිති. ඔවුන්ගේ ප්‍රතිගාමී ව්‍යාපාරයේ අනිවාර්ය තර්කනය වනුයේ රටේ ව්‍යසනකාරී සිවිල් යුද්ධය යලි අවුලුවා ලීම යි.

© www.wsws.org